# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2309/10 – 2022 දෙසැම්බර් 06 වැනි අඟහරුවාදා – 2022.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/273.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.03.02 දිනැති හා අංක 2217/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (වර්තමාන ලිපිනය - දෙහිවල, නගර සභා පටුමග, අංක 10) හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (අයි. පී. ශාන්ත නිමල්රත්න මයා වෙනුවෙන්) සහ කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 215 හි පිහිටි ලංකා ටයිල්ස් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38261 – 18 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාවේ දී ය.**

බේරුම්කරු - ඩී. එම්. එම්. බී. බක්මීවැව මැතිතුමා ඉදිරිපිටදී ය.

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 10, නගර සභා පටුමග,
දෙහිවල.
(අයි. පී. ශාන්ත නිමල්රත්න මයා වෙනුවෙන්)

*පළමුවැනි පාර්ශ්වය*

සහ

ලංකා ටයිල්ස් පීඑල්.සී.,
අංක 215,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

ආරාවුල් අංකය: IR/COM/03/2018/273.
බේරුම්කරණ අංක: A /24/2021.

2022 ජුනි මස 08 වැනි දින දී ය.

**ප්‍රදානය**

ගරු කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් 2021.02.22 දින මා පත්කර මා වෙත යොමුකර ඇත.

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ලංකා ටයිල්ස් පී.එල්.සී. ආයතනයේ රාජගිරිය ගබඩාවේ සේවය කරමින් සිටි අයි. පී. ශාන්ත නිමල්රත්න නමැති සේවකයා 2018 වර්ෂයේදී මීටියාගොඩ මැටි ශුද්ධාගාරය වෙත ද, පසුව බැලුම්මහර පිහිටි සේවා ස්ථානයට ද, නැවතත් මීටියාගොඩ මැටි ශුද්ධාගාරය වෙත ද ස්ථාන මාරු කිරීමෙන් මෙම සේවකයාට අසාධාරණයක් සිදු වී තිබේද? සිදු වී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

බේරුම්කරණය සඳහා මා වෙත ඉදිරිපත් කර තිබූ උක්ත කාර්මික ආරාවුලේ පළමු පාර්ශ්වය (අන්තර් සමාගම් සේවක සංගමය) සිය පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇති බැවින් උක්ත පාර්ශ්ව අතර තවදුරටත් කාර්මික ආරාවුලක් නොමැති නිසා බේරුම්කරණ ප්‍රදානයක් ලබාදීමට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරමි.

ඩී. එම්. එම්. බී. බක්මීවැව,
බේරුම්කරු.

2022 ජුනි මස 08 වැනි දින දී ය.

EOG 12 – 0073

මගේ අංකය: IR/COM/04/2018/239.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.06.14 දිනැති හා අංක 2127/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්මලාන, බොරුපන පාර, අභය මාවත, අංක 06ඒ හි පදිංචි වජිර පෙරේරා මයා සහ කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 354/2 හි පිහිටි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරණ අංක: A/65/2019
ආරාවුල් අංකය: IR/COM/04/2018/239

වජිර පෙරේරා මයා,
අංක 06ඒ, අභය මාවත,
බොරුපන පාර,
රත්මලාන.

*පළමු පාර්ශ්වය*
*එදිරිව*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
අංක 354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ ''තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ලෙස ආයතන ලියාපදිංචි පාඨමාලා ප්‍රතීතන හා QMS අංශයේ කටයුතු කළ වජිර පෙරේරා මහතා 2018 ඔක්තෝබර් මස 2 දින සිට අධ්‍යක්ෂක ලෙස සැලසුම් හා පර්යේෂණ අංශයට මාරු කිරීම නිසා අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

දෙපාර්ශ්වයේම ප්‍රකාශයන් එවූ පසු දෙපාර්ශ්වයටම හුවමාරු කර නැවත ප්‍රති ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදි. ඉන් පසුව විභාගය සඳහා 2020.08.18 දින කැඳවූ පසු වගඋත්තරකරු විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට දින ඉල්ලා සිටින ලදී. විරෝධතා ඉදිරිපත් කළ පසු 2021.02.23 දිනට විභාගයට නියම කර දෙපාර්ශ්වයටම දන්වා සිටියත් දෙපාර්ශ්වයම පැමිණ නොසිට ඇත. එසේම නියෝජනයක් ද නොතිබූ බැවින් ඉල්ලුම්කරු නඩුවට උනන්දුවක් නොදක්වන්නේ නම් ලිඛිතව දන්වන මෙන් නියෝග කරන ලදී.

ඒ අනුව ඉල්ලුම්කරු 2022.02.23 වන දිනැති විද්‍යුත් තැපෑල මඟින් දන්වා සිටින ලද්දේ ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් සිටීම නිසා නඩුව ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවයක් නොපවතින බවකි.

ඉල්ලුම්කාර වජිර පෙරේරා මහතාගේ විද්‍යුත් ලිපිය පරිදි මෙම නඩුව තවදුරටත් පවත්වා ගෙන යා නොහැක. එබැවින් නඩුව පිළිබඳව ඉල්ලුම්කරුගේ උනන්දුවක් නොමැති බැවින් නඩුවේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. මෙම නඩු ගොනුවේ කටයුතු අවසන් කරමින් ගොනුව පියවමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින.

EOG 12 – 0074

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.